## 201 සමිඳේ මම සූදානම්

සමිඳේ මම සූදානම් එන්න ඇතුලට
ඔබ හද මැදුරේ

මෙතුවක් කල් අඳුරේ ගිලී
දොරගුළුලා හද මැදුර වසා
සිටියේ ඔබෙන් ඇරයුම් ලැබෙන තුරු
දහසක් පැතුමන් හද පුරවාගෙන

මඟ පෙන්වන්නට කිසිවෙකු නොමැතිව
අතරමංව සැරිසරූ වෙමි සැමතැන
සමිඳෙ ඔබෙන් ඇරයුම් ලැබෙන තුරු
දහසක් පැතුමන් හද පුරවාගෙන

හබල් බිඳී ගිය නෞකාවක් සේ
රළ පෙළ දිවි සටන් කලෙමි මම
සමිඳෙ ඔබෙන් ඇරයුම් ලැබෙන තුරු
දහසක් පැතුමන් හද පුරවාගෙන